# පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූ හිතී


## පූජ්‍යපාද වලල්ගොඩ චන්දරතන හිමි.



ඉසිපතන ආරණ්‍ය සේනාසනය
ධර්මරාජ මාවත
මහනුවර.
2554
2010

# පිදුම

භව අදුර සිඳ බිඳ
මෙත් මග නිතිනි පිළිවිස
සරු කළ දහම් සොඳ
තරු නෙත එග කළ සඳ
ඇඳුරන් නමට
පුදමි බැතියෙන
නැමැද පා යුග......



# පැතුම

මෙම අමාදම් පුස්ථක
ධර්ම දානය තුලින්
වන කුසල් සම්පත්ති
උතුම් රත්නත්‍රයක් වූ
වලල්ලොඩ චන්දරතන
නායක ස්වාමීන් වහන්සේට
තව තවත් මේ ගෞතම බුද්ධ ශාසනය
ආලෝකමත් කිරීමට නිදුක් නිරෝගී
දීර්ඝායුෂ ලැබී මේ අත්බවයේම
සිව් කෙලෙසුන් නසා නිර්වාන අවබෝධයටම
හේතු වේවායි පතමු !

## - පෙරවදන -

මේ මහා භයංකාර සංසාර ගමන, මහා අදුරු පටලයකින් වැසී තිබූ අප ජිවිත වලට ආලෝකය ලබාදුන් අප නායක ස්වාමීන් වහන්සේ විසින් දේශනා කරන්නට යෙදුන රූපවාහිණී ධර්ම දේශනාව පොතක් මගින් ඔබ අතට පත්කිරීම මා ලද මහා භාග්‍යයකි. අප ගුරු පියාණන් වහන්සේ මෙම ධර්ම දේශනාවෙන් මුළු ලෝකයම තමා තුලින් බැලීම මාර්ගය බුද්ධ දේශනාව ඇසුරින් එළිකර දෙන අතර මේ දුක කියන එකත් දුක ඇතිවීමට හේතුව දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය "බ්‍යාමත්තකේ කලේබරේ සසඤ්ඤදතෙ ලෝකංච පඤ්ඤාපෙමි, ලෝක සමුදයංච පඤ්ඤාපේමි, ලෝක නිරෝධයංච පඤ්ඤාපේමි මෙතන බව මැනවින් පහදා දී තිබෙන අතර පිංවත් ඔබටද මේ ධර්ම දේශනාව පොතක් වශයෙන් පත් කිරීමට ප්‍රථම නායක ස්වාමින් වහන්සේගේ රූපවාහිණි ධර්මදේශනාව සඳහා මූලිකත්වයගෙන කටයුතු කලේ තැන්නේ කුඹුර ප්‍රදේශයේ පදිංචි අනුලා මැණිකේ අමරකෝන් මෑණියන්ය. විශේෂයෙන්ම එම මෑණියන් මෙම මහඟු කර්තව්‍යයට දායක වූයේ තමන්ගේ මෑණියන්ටත් පියාණන්ටත් පිං පැමිණවීම සඳහායි. එනම් අපි සියළුම දෙනාමත් මේ සියළු කුසල සම්පත්තිය අනුමෝදන් කරමු. අනුමෝදන් වෙත්වා කියා පිං පෙත් පමුනවමු.

***තෙරුවන් සරණයි.***

බදුල්ලේ සුසීමරතන හිමි
ඉසිපතන ආරණ්‍ය සේනාසනය
ධර්මරාජ මාවත,
මහනුවර.
081-4993329

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///**

**"කිංසූධ චිත්තං පුරිසස්ස සෙට්ඨං**
**කිංසු සුචිණ්ණෝ සුඛමාවහාති**
**කිංසු හවේ සාධුතරං රසානං**
**කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති**

**සඬ්ධ චිත්තං පුරිසස්ස සෙට්ඨං**
**ධම්මො සුචිණ්ණෝ සුඛමාවහාති**
**සච්චං හවෙ සාධුතරං රසානං**
**පඤ්ඤඤ ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති ති......"**

**පිංවත්ණි** !

පිංවතුන් ලෝක තලයේ මනුෂ්‍යයන් වශයෙන් ඉපදිලා විශේෂයෙන් බුද්ධෝපාද කාලයක අඳ, ගොළු බිහිරි ආදී දුර්වල කම්වලින් තොරව මහා සංසරත්නය, චතුරාර්ය සත්‍යය ධර්මය දේශනා කරන කල්හී බෞද්ධයන් වෙලත් ඉපදිලා බුද්ධශාසනයේ ඇති උපරිම වටිනාකම නෙලාගන්නේ නැතිව නිෂ්කාරනේ කාලය ගෙවි යන්ඩ ඉඩ හැර අත්හැරදමා බොහෝ මිනිසුන් මේ ලෝක තලයේ ජීවත් වෙනවා. මෙන්න මෙවන් අවස්ථාවක බුද්ධ ශාසනයට ඇතුල්වෙලා පැවිදි දම් පුරමින් සංසාර සාගරයේ තියෙන භයන්කාරකම හදුනා ගත්ත අපට ඔබ සැමට අනුශාසනා කරන්න යැයි තිලෝගුරු බුද්ධානුශාසනයේ සඳහන් වෙනවා.

**"චරථ භික්ඛවේ චාරිකා බහුජන හිතාය බහුජන සුඛාය අත්තාය හිතාය සත්ථාය දේව මනුස්සානං"** මෙන්න මේ බුද්ධානු ශාසනාව යටහත් උණු මහා සංඝරත්නය වන අපට ධර්ම දේශනා ලෝක සත්වයාට කරන්න ලැබීම මහා වාසනාවක්. පිංවත්නි, තථාගත

බුද්ධ ශාසනයේ උත්තරීතර වාසනාවන්ත නිර්වාණ සම්පත්තිය ලබා ගන්න බොහෝ අය හිතනවා ඉතා අමාරු කාර්‍යයක්. සත්‍යම සත්‍යයක් තථාගත බුදු හාමුදුරුවෝ දේශනා කරන්නේ ඉතාම අමාරු දෙයක් තමයි බුද්ධ ශාසනයේ මාර්ග ප්‍රතිඵල ලබා ගන්න එක. බුද්ධ ශාසනයේ ශීල, සමාධි, ප්‍රඥා මේ තුනට පැමිණෙන අය ඉතාම ටිකයි. සංසාර සාගරයෙන් එතරවෙන අය ඉතාම ටිකයි කියලා ලොව්තුරා බුදු හාමුදුරුවෝ උදාහරණයකිනුත් පැහැදිලි කරනවා. නියපොත්ත උඩට පස්ටිකක් අරගෙන ලග හිටපු හාමුරුවන්ට පෙන්නලා අහනවා **"මහණෙනි මගේ මේ නිය පොත්ත උඩ තියෙන පස්ටිකද වැඩි මහ පොලොවේ තියෙන පස්ද වැඩි"** කියලා අහනවා. ඕනම කෙනෙකුට තේරෙන දෙයක්. ඉතාම ටිකයි නිය පොත්ත උඩ තියෙන පස්, මහ පොලොවෙ පස් අනන්තයි අපරිමානයි.

මේ උදාහරණයෙන් බුදුරජාණන් වහන්සේ කල අනන්ත දේශණා තිබෙනවා. සිල් රකින අය නිය පොත්ත උඩ පස්ටික බදුයි. සිල් කඩන අය මහ පොලොවේ ඇති පස් ගොඩ වගෙයි. එවගේම සමාධිය දියුණු කරගන්න අයත් ඔය විදිහමයි ඉතා ටිකයි. මහා ප්‍රඥාව ලබලා සසරින් එතර වෙන අයත් ඉතා ටිකයි. නිය පොත්ත උඩ පස් ටික බදුයි. ඉතිං මෙම තථාගත බුද්ධානුශාසනාව සත්‍යම සත්‍යයක් බව අද මම මේ වෙනකොට මුළු ලක්දිව පුරාම භාවනා වැඩ සටහන් කරමින් ඇවිදින අතරේ දක්නට ලැබෙනවා මේ වෙලාවෙදි උනත් මේ මොහොතෙදි ඇහුවත් **"ඔබ පන්සිල් රකිනවාද කියලා"**, හරියට රැකගන්න බෑ හාමුදරුවනේ කියන එකයි උත්තරේ.

ලංකාවේ හැම තැනකම භාවනා වැඩසටහන් කරන මා, එම තැන්වලදී මා අහන ප්‍රශ්නයත් එයයි. බොරු කියනවද කියලා ඇහුවොත් ඔව් කියලයි කියන්නේ නෑ! කියලා කාටවත් කියන්න බැරි තරමයි. හේතුව තමා ජීවත් වන ගිහි ජීවිතය ඉතාම බාධකයි. තථාගත බුදු හාමුදුරුවෝම වදාරනවා **"සම්භාදෝ අයං ඝරාවාසෝ**

**රජස්සායතනං ඉති",** මේ ගිහි ජීවිතය තුල තිබෙන්නෙම පන්සිල් කඩාගන්න තියෙන රටාවක්මයි. මව-පියා, දරු - සහෝදර, නෑදෑ හිත - මිතුරන් ආර්ථික ගොඩනැගීමට සෑම තැනකදීම බොරුවෙන් තොර ජීවිතයක් නැති තරම්මයි. මෙවන් වූ ජීවිතයක ප්‍රතිඵලය කුමක්ද ? තමාම ජීවිතය තුලම අකුසල ධර්මයන් කරගන්නවා. පව් කරගන්නවා පරලොව දුගතිගාමී වෙනවා. සංසාරය දික් කරගන්නවා මේ කව්ද බාල අය නේද ?

තථාගත බුදු හාමුදුරුවො දේශනා කරනවා.

**"දීඝාජාගරතො රත්ති - දීඝං සන්තස්ස යෝජං**
**දීඝො බාලානං සංසාරො - සද්ධම්මං අවිජානතෝ"**

නිදිමරන අයට අයට රාත්‍රිය දිගයි වගෙ ගමන් යන්නාට මාර්ගය දිග වගේ මේ සංසාරේ දිගයි !හැබැයි බාලයාට !

මෙන්න මේ බාලයා ලොවුතුරා බුදු හාමුදුරුවෝ දැක්කේ කවද්ද සම්බුද්ධත්වය පත්වුන මොහොතේමයි තමා අවබෝධ කරගත් ඒ උතුම් දහම මුළු ලෝකයාට දේශනා කරන්නමයි අනන්ත කාලයක් සංසාරේ සැරිසැරුවේ. මෙසේ සංසාරේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී පුරා අවසානයේ වෙසක් පුන් පෝය දිනයේ සත්‍ය අවබෝධකරගත්ත බුදුහාමුරුවෝ දින හතලිස් නවයකට පස්සේ ලෝක සත්වයා වෙත නෙත් යොමා නුවණැසින් බැලුවා කාටද මම දහම් දෙසන්නේ කියලා දුටු එකමදේ තමයි ධර්මය අවබෝද කරගන්න කෙනෙක් නෑ ! හිටියා හතරදෙනෙක් ආලාම, කාලාම, උද්දකරාම පුත්ත ආදී මේ අය අරූපාවචර ලෝකවල ඉපදිලා ඇස්, කන්, නාස, දිව, ශරීර මනවල් නෑ. ඒ අයට තියෙන්නේ සිතක් පමණයි. සිත තුල පමණක්ම ජිවත් වන ස්වභාවයක්, කන් නැතිව අහන්න බෑ! අවබෝධ කරගන්න විදිහක් ඇත්තේම නෑ ! බුද්ධානුශාසනාවේ පළවෙනි

දේශනාව කුමක්ද ? අහන්න එන අයට ඉස්සරලාම කියන්නේ **"සුනාථ, ධාරේථ, චරාථ ධම්මේ"** අහගන්න හොඳට සිතේ ධාරණය කරගන්න මා කියන විදිහට හැසිරෙන්න.

මෙන්න මේ අනුශාසනාවට අනුව නම් කන් තිබෙන්නට ඕන මතක තියාගෙන හැසිරෙන්නත් ඕන. එහෙමනම් බණ අහන්න මනුෂ්‍යය ආත්ම ඉතාම වටිනවා මෙසේ මනුෂ්‍යය ආත්ම ලබලා ඉන්න අය දිහා තමයි බුදුහාමුදුරුවෝ බැලුවේ. දෙවියන් දිහා බැලුව නමුත් මොකද්ද තත්වේ සැම කෙනෙක්ම අන්ධවයි කටයුතු කරන්නේ පිස්සන් සේයි සැරි සරන්නේ බුදු හාමුදුරුවෝ වදාල **"අන්ධ භූතෝ අයට ලෝකේ"** මේ ලෝකයේ ඉපිද ඉන්නවා අන්ධව **"සබ්බේ පාථුග්ජනා උම්මත්තකා"** සියළු දෙනා අස්ශ්‍රතවත් වෙලා අස්ශ්‍රතවත් පෘථජ්ජන කියලා කියන්නේ, අහන්න ඕන ටික අහන්න ලැබිලා නෑ ! ඒ නිසා පිස්සන් සේ සැරිසරනවා. තථාගත බුද්ධානුශාසනාව මෙසේ අවබෝද කරගත්ත සම්මා සම්බුදු හාමුදුරුවෝ බැලුවා මොකක්ද මේ තියෙන දර්ශනය තේරුම් ගන්න බැරිකම කියන දේ.

මෙන්න මෙතෙන්දී තමයි අපිට ඇයි අපිට බැරි කියන එක තේරුම් ගන්න ඕන. ඔන්න තථාගත සම්මාසම්බුදු හාමුදුරුවෝ මෙහෙම බලලා බලලා අවසානයේ තීරණය කළා දේශනා නොකල යුතුයි කියලයි සඳහන් වෙනේනේ අප අහලා තිබෙන්නේ මා දහම් දේශනා කිරිම වෙහෙසට පත් වීමක් පමණයි. ඒ නිසා දේශනා කරලා වැඩක් නෑ කියලා සඳහන් වෙනවා. අහලා තිබෙන්නේ බ්‍රහ්මයාගේ ආරාධනාවෙන් නැවත දහම් දෙසන්න පටන් ගත්තා කියලා. ඉතිං මෙසේ දහම් අසන්න බැරි ඇයි කියලා අපි සොයා බලන්න ඕන ! හැබැයි පිංවතුනි තථාගත බුද්ධානු ශාසනාව ප්‍රඥාවන්තයින්ට විතරයි.

**"පඤ්ඤා වන්තස්ස අයං ධම්මෝ**
**නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස"**

සම්මා සම්බුදු හාමුදුරුවෝ දේශනා කරන්නේ ප්‍රඥාවන්තයින්ට විතරයි ධර්ම දේශනා කරන්න වෙන්නේ අනිත් අයට ධර්ම දේශනා කරලා වැඩක් නෑ ! ''**ඒස විඤ්ඤෙඤ්ඤො පුරිසෝ**'' නුවනැත්තනි එන්න ඔන්න බුදු හාමුදුරුවෝ කථා කරනවා නුවනැත්තනි එන්න ! කව්ද මේ නුවනක් කාරයෝ අපි අනුවනක් කාරයෝද ? අපිට මොකද වෙලා තියෙන්නේ ? ධර්මය ශ්‍රවණය කරන්න බැරිද ? මෙන්න මේ ප්‍රශ්න වලට පිළිතුරු සහිතව අපි දහම් ශ්‍රවණය කරන්න ඕන. එතෙන්දි තමයි තථාගත බුද්ධානු ශාසනාව මොකක්ද ? ඇයි ඒවා අපිට අහලා තේරුම් ගන්න බැරි ? බුදු හාමුදුරුවෝ ලොව පහල වී වදාලේ මොකක්ද කියලා.

පිංවත්නි, බුදු පියාණන් ලොව පහල වී වදාලේ චතුරාර්ය සත්‍යයි. ත්‍රි ලක්ෂණ අවබෝධයයි. මේක තමයි සම්බුද්ධ දේශනාව. **"අට්ඨක්කරා තිණිපදා සම්බුද්ධා ප්‍රකාශිතා"** සම්මා සම්බුදු හාමුදුරුවෝ වදාරනවා අකුරු අටයි, වචන තුනයි මම දේශනා කරන්නේ. කොහොමද ? කවදද ? මේක දේශනා කළේ. ආනන්ද හාමුදුරුවෝ කියන්නේ ධර්ම භාණ්ඩාගාරිකනේ බුදුහාමුදුරුවෝ පිරිනිවන් පාන්න ආසන්න සමයේ ආනන්ද හාමුදුරුවෝ දිනක් අහනවා "තථාගත බුදුරජාණන් වහන්ස තවත් මට මතක තබා ගැනීම සඳහා මොනයම් හෝ දහමක් දේශනාකරන්න තියෙනවද කියලා.

බුදු හාමුදුරුවෝ වදාරන්නේ මා දේශනා කළයුතු සියල්ල දේශනාකර අවසානයි. ඒ තමයි ත්‍රිලක්ෂණය. මෙන්න මේ ත්‍රිලක්ෂණ අවබෝධය යමෙක් ලැබුවානම් ඔහු සෝවාන් සකදාගාමි, අනාගාමි, අරිහත් මගඵල ලබන අයයි. මෙන්න මේ අවබෝධය ලබන අය පිරිසිදු වෙනවා ඒ කියන්නේ මේ අපිරිසිදු ලෝකයට ආපු අය පිරිසිදු වෙනවා, අරහත් බලයට පත්වෙනවා මේ ලෝකය සමඟ තිබෙන සියලු සම්බන්ධතාවයන් දුරුකරනවා කියන එකයි බුද්ධ දේශනාව

**"සබ්බේ සංඛාරා අනිච්චාති - සබ්බේ සංඛාරා දුක්ඛාති
සබ්බේ ධම්මා අනත්තාති - යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛේ - ඒසමග්ගෝ විසුද්ධියා"**

සියළුම දේ අනිත්‍යයි ! දුකයි ! අනාත්මයි ! කියලා යමෙක් නුවණින් අවබෝධ කරගත්තොත් ඔහු මේ ලෝකය අතහැර දමනවා. මෙය තමාතුලින් දුටු බුදු හාමුදුරුවෝ ලෝකයට දේශනා කලා මම ඔබට දහම් දේශනාකරනවා නමුත් ඔබම කරගත යුතු වැඩක් තිබෙනවා **"තුම්හේ කිච්චං ආතප්පං - අක්ඛාතාරෝ තථාගතා"** ඔබ විසින්ම කරගත යුතු වැඩක් තිබෙනවා. මම ඔබට දහම් දෙසනවා. ඔබම අවබෝධ කර ගන්න. මෙහෙම බුදු හාමුදුරුවෝ වදාරනවා. සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පෙරුම් පුරලා ලෝක සත්වයාට පිහිට වෙන්න ආපු බුදු හාමුදුරුවෝ අපටම වැඩ පටන් ගන්ඩළු. බුදු හාමුදුරුවෝ මාර්ගය පෙන්නන්නල්ලු ! ඇයි මෙහෙම අපට කලේ ? මේක තමයි සත්‍ය ගමන, මෙහෙම වෙන්න හේතු අපි හොයා ගන්න ඕන, ස්වක්ඛාතෝ ගාථාවේ මේක තමයි පිංවත්නි දීලා තියෙන පණිවිඩය. අපි ගෙදරදි වන්දනා කරනවා, ඔය ගාථාව කියලා පන්සලේදි වන්දනා කරනවා, අනුරාධපුරයේදී, අටමස්ථානයේදී, දඹදිව ගිහිනුත් වන්දනා කරනවා මාත් එහෙම කලා මට මතක මට අවුරුදු හයේ හතේ කාලේ ඉදන්ම මේ ගාථාව කිව්වා මට අවුරුදු හතලිස් තුන වෙනකමුත් කිව්වා හැබැයි මමවත් දැනගෙන හිටියේ නෑ ! කුමක්ද මේ ගාථාවෙන් කිව්වේ කියලා. අපි හිතන්නේ දහම් වදිනවා කියලා සුපටිපන්නෝ ගාථාවත් මෙහෙමමයි මම කිව්වේ. අපි තෙරුවණ් සරණ යනවා, වන්දනා කරනවා කියලා කථා කරනවා සිද්ද වෙලා තියෙන්නේ මොකක්ද ගිහින් තියෙන්නේ නොමගමයි. මටත් බැරි උනා අවුරුදු හතලිස් තුන විතර වෙනකල් පන්සිල් පද පහවත් රැක ගන්න. ඒක කරගත්තේ ඉන් පස්සේයි. සීලය, සමාධිය, ප්‍රඥාව පරිපූර්ණ කරගෙනමයි. මම මෙතෙන්ට බණ කියන්න ආවේ. එක එහෙම කර ගන්න ලැබුනේ අර ස්වාක්ඛාථෝ ගාථාවේ තියෙන අර්ථය හොඳට තේරුම් ගත්ත නිසා.

දේශනාවේම සඳහන් වෙනවා **"යෝ ධම්මං පස්සති සෝ මං පස්සති"** යමෙක් ධර්මය දකිනම් ඔහු බුදු හාමුදුරුවෝ අදුරනවා. දකිනවා අවබෝධ කර ගන්නවා එහෙමනම් සංඝරත්නය අඳුරන්න පුළුවන් වෙන්නේ එයාටමයි. ඒ නිසා මා සුදානම් වන්නේ අද විශේෂයෙන්ම ස්වක්ඛාතෝ ගාථාවේ අර්ථය තුලින්ම තථාගත බුද්ධානු ශාසනාව හෙලිදරව් කරන්නයි.

**"ස්වාක්ඛාතෝ භගවතෝ ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහි පස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදි තබ්බෝ විඤ්ඤූ හිතී"**

මේ ගාථාව මේ වෙලාවේදී මතක් කර ගත්තට මුලින්ම ආලවක යකාට දේශනා කරන ලද ගාථාවයි, මම මාතෘකා කර ගත්තේ.

මේ ලෝකේ පුරුෂයාට වටිනාම දේ මොකක්ද ? සැප ගෙනල්ලා දෙන්නේ මොනවගෙන්ද ? ජීවිතයක් ගත කරන්න ඕන මොන විදිහටද ? දේශනා කලේ මේකමයි. ශ්‍රද්ධාව තමයි මේ ලෝකේ ලොකුම ධනය, ශ්‍රද්ධාව කියනිනේ මොකද්ද දන්නවාද ? මා මාතෘකා කොට ගත්ත දැන් ආරම්භ කරපු ගාථා රත්නය ධම්ම රත්නය, බුද්ධ රත්නය, සංඝරත්නය යන මේ ත්‍රිවිද රත්නය පිළිබඳව මනාව අවබෝධකර ගැනීමයි. අපි මේ ලෝකේ බෞද්ධයන් වෙලා ඉපදිලා බුදු හාමුදුරුවන්ට හරි කැමැත්තෙන් ඉන්නවා. ධර්මයටත්, සංඝරත්නයටත් කැමැත්තෙන් ඉන්නවා. හැබැයි පන්සිල් පද පහවත් රකින් නෑ ! සංඝරත්නයට කැමතියි, සංඝරත්නය සිල් රකිනවා නමුත් අපි සිල් රකින්නේ නෑ ! බුද්ධ රත්නයට කැමතියි බුදුහාමුදුරුවෝ අනන්ත සීල වන්තයි ! අපි සිල් රකින් නැ ! ධර්මය කියන්නේ මොකකද්ද ? සිල්වන්ත භාවයේ උපරිම තලේට යන්න කියලා අපි සිල් රකින් නෑ ! එහෙමනම් අපි ලඟ ශ්‍රද්ධාව කියන එක තියෙනවද ? කියන එකයි සිතා බලන්න ඕන.

මෙන්න මේ කැමතියි කියලා තියෙන ශ්‍රද්ධාව තමයි ඔය අමූලික ශ්‍රද්ධාව කියලා කියන්නේ. මොකක්වත් අගක් මුලක් නැති කැමැත්තක් හැබැයි ඔය කැමැත්තේ ස්වභාවය මොකද්ද කන්දක් මුදුනේ තියෙන ගහකින් වැටිච්ච කොලේකට වෙන දේමයි. කව්රු හරි අන්‍ය ආගමික කෙනෙක් කියලා දුන්නොත් මේ පැත්තට එන්න කියල ඒ පැත්තට යනවා. ආයෙත් හාමුදුරාවෝ කෙනෙක් බණ ටිකක් කිව්වොත් අයේ මේ පැත්තට එනවා ඔන්න ඔහොම දෙපැත්තට යන කිසිම තැනක එක විදිහට ඉන්න බැරි කමට තමයි ඔය අමූලික ශ්‍රද්ධාව කියන්නේ.

ඊළඟට මේ ශ්‍රද්ධාවන්ත බව ටික ටික ගැඹුරු වෙනවා. තථාගත බුදුහාමුදුරුවො වදාල ත්‍රිපිටක දර්ශනය ටික ටික ශ්‍රවණය කරන්න ලැබුනම, ගාථා ආදිය එක එක තේරෙන්න ගත්තම ආකාරවතී ශ්‍රද්ධාව කියලා එකක් මතු වෙනවා. මෙවන් ගුණයක් බුදු දහමේ තියෙනවා. හරි වටිනවා අපේ ලෝකේ අපිට ගුණ දහම් රැකගෙන දෙමාපියෝ දරුවෝ එකතු වෙලා නෑ-හිතමිතුරන් එකතු වෙලා ජිවත් වෙන්න අපායෙන් මිදෙන්න හොද පාරක් තිබෙනවා. දිව්‍ය ලෝක වල යන්න හොද පාරක් තිබෙනවා. නිවන් දකින්න හොද පාරක් තිබෙනවා කියලා විවිධ කරුණු අහන්න අහන්න එයාගේ තෙරුවන් කෙරෙහි තියෙන ගෞරවය තව තවත් වැඩි වෙනවා. නමුත් පිංවත්නි මෙයත් අර වගේමයි කොයි වෙලාවේ ආපස්සට හැරෙන්න බැරි නෑ. ඇයි ඒ පණිවිඩයක් හරියට මල්ලක් ඇතුලේ තියෙන දේක වර්ණනාවක් වගේ හොඳයි වටිනවා, ප්‍රියයි, අලංකාරයි, ලස්සනයි මල්ල ඇතුලේ තියෙන දේ ගැන වර්ණනා කරනවා. විශ්වාස කරනවා නමුත් ඇරලා නොබලා හොදයි කියන දේට සමානයි අකාරවතී ශ්‍රද්දාව. කොයි වෙලේ වෙනස් වෙයිද දන්නෑ ! එහෙම තේරුම් ගත්ත අයට බදු හාමුදුරුවෝ වදාරන්නේ තුච්චයි කියලා. තුච්ච කියන්නේ මොකද්ද හිස් !

බුදු හාමුදුරුවන් ජීවමානව වැඩ සිටින කාලේ පෝට්ලක කියන හාමුදුරුවෝ ත්‍රිපිටක ධර්මය හොඳට පාඩම් කරලා අනිත් අය සමග තර්ක විතර්ක කරන්න පවා දක්ෂ උනා. දිනක් මේ හාමුදුරුවෝ බුදු හාමුදුරුවෝ ලඟට ආවාට පස්සේ බුදු හාමුදරුවන් මේ හාමුදුරුවන්ට ආමන්ත්‍රනය කලේ **"තුච්ච පෝට්ලක"** කියලා. යන්ඩ ලෑස්ති වෙනකොටත් ආමන්ත්‍රණය කරනවා තුච්ච පෝට්ලක එනවද ? යනවද? කියලා. කුමක්ද මේ කියන්නේ කරුණු අසාදැන තේරුම් ගෙන තෙරුවන් කෙරෙහි ඇති ශ්‍රද්ධාව කියලා කියන්නේ අවබෝදේ නොවෙයි කියලා ඕකට කියන්නේ උගත්කම කියලා. උත්කම කියන්නේ බුද්ධිමත්කම නෙමෙයි නුවනක් කාරකම නෙමෙයි කවුරු හරි කියපු දෙයක් අහගෙන ඔහේ ජිවත් වෙන ගමන් මේ සමාජයේ ජීවත් වෙන්න. හැබැයි උගත් කම ඕන. හැබැයි මේ ලෝකයෙන් ඉවත් වෙන්නනම් බුද්ධිමත් කමයි ඕන. ඒකට තමයි බුද්ධානුශාසනාව වැදගත් වන්නේ.

එතකොට පිංවතුනි ඔය ආකාරයට ආකාරවති ශ්‍රද්ධාව තව දියුණු වෙනවා කියන්නේ කුමක්ද ? තෙරුවන් පිළිබඳ තමන් තුලින්ම තේරුම් අරගෙන මල්ලක් ඇතුලේ තියනෙ එක ලිහලා බලලා ඇත්තම ඇත්ත තේරුම් ගන්න එකයි. බුදු හාමුදුරුවෝ වදාරනවා**"බ්‍යාමත්තේ කලේබරේ සසඤ්ඤතේ ලෝකංච පඤ්ඤාපෙමි ලෝක සමුදයංච පඤ්ඤාපේමි ලෝක නිරෝධයන්ච පඤ්ඤාපේමි නිරෝධගමානි පටිපදාය පඤ්ඤාපේමි"**

මොකද්ද මේ පෙන්වන්නේ චතුරාර්ය සත්‍යයි. චතුරාර්ය සත්‍යයයේ මුල්ම එකෙන් කරන්නේ ලෝකය පෙන්වන එකයි. ලෝකය චතුරාර්ය සත්‍යය අපි අහල තියෙන හිටියට දුක්ඛ සත්‍යය ඉතිං දුක්ඛ සත්‍යයට ලෝකය කියනවා **"දුක්ඛේ පටිත්තිතෝ ලෝකේ"** කියලත් සඳහන් වෙනවා පාලියෙන් මේ ලෝකේ තියෙන්නේ දුඛ මතයි පිංවත්නි ! බුදුරජාණන් වහන්සේ වදාරන්නේ තමාතුලින් ලෝකය දකින්න ! දුක දකින්න ! දුකට හේතුව දකින්න කියන්නෙත් තමා

තුලින් නිර්වාණය දකින්න කියන්නෙත් තමා තුලින් එකට යන ගමන් මාර්ගය දකින්න හඳුනා ගන්න කියන්නෙත් තමා තුලින් පිංවත්නි ! එතකොට බුද්ධාගම කොහෙද තමා තුල. දැන් එතකොට අපි කොහෙන්ද ? හොයන්න ඕන ? තමා තුලින් !

අපි මේ බණ අහන්නේ දන් දෙන්නේ, සිල් රකින්නේ, භාවනා කරන්නේ නිවන් දකින්න. සංසාරෙන් එතර වෙන්ඩ කියන අදහස තමයි ඕනම බෞද්ධ පිංවතෙකුගේ බලාපොරොත්තුව බව කොහෙදිත් කතා කරන්නේ ඉතිං ඔනෙ ඔය වැඩේ. එහෙනම් කරන්න තියෙන වැඩේ තමයි තමන් තුලින් දහම් දැකීම. මා ලස්සන පාඨයක් අහලා තියෙනවා අපේ ස්වාමින්වහන්සේලාගෙන් **"තමන් තුලින් දහම් දැකලා, දහම් තුලින් බුදුන් දකින්න බුදුන් තුලින් නිවන් දකින්න කියලා"** තමන්තුලින් චතුරාර්ය සත්‍යය දැකලා ඒ තුලින් බුද්ධිමත් වෙලා බුද්ධිමත් භාවය තුලින්ම සසරින් එතර වෙන්ඩ කියන එකමයි. ඒ පාඨයෙන් මා දැනගත්ත අදහස වුයේ.

ඉතිං මේ ඔක්කෝම දහම් විවිධාකාර තැන්වලදි විවිධ විදිහට ශ්‍රවණය කරපු මටත් හිතුනා ඇත්තටම මේ වැඩේ කරන්ටම ඕන කියලා සතර සතිපට්ඨානේ සඳහන් වෙනවා "යමෙක් සතර සතිපට්ඨානය පරිහරණය කලානම් ඒකාන්තයෙන්ම වැඩිම අවුරුදු හතක් ඇතුලත ඒකාන්තයෙන්ම අනාගාමී හෝ අරිහත් ඵලයට පත් වෙනවා" කියලා තමන් අකමැති උනත් පත්වෙනවා කියලයි තියෙන්නේ. ඒ කියන්නේ සිරිපාදය පැත්තට හැරිලා ගමන් කරනවානම් යමෙක් අමාරුවෙන් අකමැත්තෙන් මට යන්න බෑ ? කිය කියා හෝ ගමන නවත්තන්නේ නැතිව සිරිපදාය මුදුනට යැවෙනවාමයි වගේ ඒකයි සතර සතිපට්ඨානය. යමෙක් භාවිතා කරනවානම් එහි ප්‍රතිඵලය ඒකාන්තයෙන්ම මාර්ගඵල ශාන්ත අමාමහ නිවනමයි කියන එක මට ප්‍රත්‍යක්ෂ දහමක්මයි.

පිංවත්නි, අපි මේ වැඩේ කරන්න ඕන කොහොමද කරන්නේ ස්වාක්ඛාතෝ ගාථාවේ තේරුම අදුරාගෙන යනකොට මේ දේ සිද්ධ වෙනවා ස්වාක්ඛාතේ භගවතෝ ධම්මෝ - තථාගත බුද්ධානු ශාසනාව තිලෝ ගුරු බුදු හාමුදුරුවෝ ඉතාම මැනවින් දේශනා කලා කියලා සඳහන් වෙනවා. මෙකද්ද මේ මැනවින් දේශනාකරනවා කියන්නේ ඕනම දෙයක් තෝරා ගන්නකල් බුදුහාමුදුරවෝ වදාරනවා වර්ථමානයේ තියෙන තත්වය ඉස්සෙල්ලා අදුරාගන්න ඕන. අදුරාගෙන මෙය සකස් වී ඇත්තේ කුමකින්දැයි මුල හොයන්න ඕන. ඊලඟට මේකට මොනවද වෙන්නේ කියලා අග හොයන්න ඕන. එහෙමයි බුද්ධානුශාසනාව හැබැයි පිංවත්නි මේ මුළු ලෝකේ ඇති සියල්ලම පිළිබඳ වී අවබෝධ ලැබීම තරම් අමාරු වැඩක් තවත් නෑ.

ඒ මොකද මේ ලෝකයේ ඉන්න හැම සත්වයාගේම ස්වභාවය ආශාව මුල්කරගෙන නැත්නම් තරහා මුල්කරගෙන නේද. ඕක ඇත්තක්ද කියලා අපි බලමු. දැන් ලෝකයේ ඉන්න ඔක්කෝම සත්වයෝ බුදු හාමුදුරුවෝ එක නමකට ඇතුළ් කරනවා **"දරුවා"** කියලා හැම සතෙකුටම දරුවා කියලා බුදු හාමුදුරුවෝ වදාරනවා. මේක ඇත්තක්ද අපි අපේ ගෙදරින් බලමු.

අම්මයි, තාත්තයි, දරුවයි දැන් **"මම"** දරුවා ! ඇයි අම්මා, තාත්තා ඒ අයත් කවදා හරි දරුවෝ එතකොට ලෝකයේ තවත් සතෙක් ඉන්නවද මවයි, පියයි, දරුවයි එකතුව තුන්දෙනාම දරුවෝ ඒකයි තථාගත බුදු හාමුදුරුවෝ ලෝකේ ඉන්න හෑම සතෙකුටම දරුවා කියලා වදාලේ. තවත් මේ ලෝකේ දෙයක් තියෙනවා ඒවට බුදු හාමුදුරුවෝ වදාලේ **"ධනය"** කියලයි. එතකොට ලේකයේ ඇති සියල්ල මොනවද ? එක්කෝ ධනය නැත්නම් දරුවො ඒ කියන්නේ පන ඇති ඒවයි පණ නැති ඒවයි නේද පණ ඇති ඒවා දරුවෝ පණ නැති එවා ධනය.

**"පුත්තා මත්ථි ධනං මත්ථි - ඉති බාලෝ විහඤ්ඤති අත්තාහි අත්ථනෝ නත්ථි - කුතෝ පුත්ථා කුතෝ ධනං"**

තථාගත බුදුහාමුදුරුවෝ ලෝකයාට දේශනා කල සද්ධර්මය සම්පූර්ණයෙන්ම පිංවත්නි ඔය ගාථාව තුල තිබෙනවා.**"පුත්ථා මත්ථි"** දරුවෙක් ඇත. **"ධනං මත්ථි"** ධනයක් ඇත. ඔන්න ලෝකයේ ඇති දෙක සත්වයයි වස්තුවයි කියලා අපි කතා කරන දේ පණ ඇති දේවලුයි පණ නැති දේවලුයි. පණ ඇති දේවල් හැටියට දෙපා සත්තු බොහෝ පා ඇති සත්තු පා නැති සත්තු කියලා අපි හතර වර්ගයක් අහලා තියෙනවා. දැකලත් තියෙනවා. නොදැක්ක සත්තුන් අනන්තයි. දිව්‍ය, බ්‍රහ්ම, සක්‍රයෝ, ප්‍රේත, යක්ෂයෝ ඒ අය අපි දැකලා නෑ ! නමුත් තථාගත බුද්ධානුශාසනාවට අනුව අපි පිළිගන්නවා මෙතෙක් කල් දහම සත්‍යනම් ලෝතුරු දහම අසත්‍ය වෙන්න බැ ! කියන තීරනය මත. ඒත් ඒ සියල්ලෝම එකතු කරලා තමයි බුදු හාමුදුරුවෝ අපිට මේ දරුවා කියන සළකුන දීලා තියෙන්නේ දැන් ඉතිං ස්වකාතෝ භගවතෝ ධම්මෝ මෙකද්ද දරුවයි වස්තුවයි ගැන මනාව දේශනා කර වදාළා. කව්ද මේ දරුවා කියලා හදුනා ගන්ඩ ? කොහෙන්ද තමන් තුලින්.

බුදු හාමුදුරුවෝ වදාරනවා අනුන් තුලින් දරුවෝ හදුනන්න බෑ ! ඇයි දරුවා කියන්නේ **"හයකට"** කියලා වදාරනවා. මොනාද මේ හය ආයතන හයයි. උප්පත්තිය ගැන දේශනා කරන බුදු හාමුදුරුවන් වදාරනවා **"ආයතනානන් පටිලාභෝ ස්කන්ධානන් පාතුභාවෝ ජාති"** ආයතන හයක් සහ ස්කන්ධයන්ගේ පහල වීම සහ අයතනයන්ගේ සකස් වීම තමයි උප්පත්තිය කියන්නේ ස්කන්ධ කියන්නේ පණට පිංවතුනි ! ආයතන කින්නේ ඇඟට, අපිට ඔය දෙකම තියෙනවාද ? තියෙනවා කෝ මුහුණේ තියෙනවා ඇස්. කන්, නාස, දිව, ශරීර, මොලය ඕනම කෙනෙක් තමන් තුලට බැහැලයි බලන්න කියන්නේ කාටද ? ඔන්න ඔතන තමයි තැන, දැන් තමා

පැත්තටම හැරෙන්න වෙනවා. හැබැයි මහා කණ්නාඩියක් ලඟට ගියාට කමක් නෑ ! පේන් නෑනේ නැත්නම් තමන්ට ලෝකයාට වෙලා තියෙන්නෙත් ඕකනේ. මොකද සියළු පව්වැඩ කරමින් අපාගත වෙමින් සසර දික් කර ගන්නේ ඔය පැත්තට හැරිච්ච නැති හින්දමනේ

මොකද ? ඇහේ වැඩේ පිට රූප දකින එකනේ කනේ වැඩේ පිට ශබ්ද අහන එක, නහයේ, දිව, කය, මනේ වැඩේ පිට තියෙන ගන්ධ, රස, ස්පර්ශ, සිතුම් හොයන එකමනේ ඒ පැත්තටම ඇලිලා අනන්ත ගමනක් වේගයෙන් ගමන් කලා. තමන්ගේ පැත්ත ගැන මොහොතක්වත් හිතුවේ නෑ ! තථාගගත බුදු හාමුදුරුවෝ හැමවෙලාවේම අහන්නේ ඔබ කැමති අනුන් ගැන හොයන්ඩද තමාගැන හොයන්ඩද කියලා. උරුවෙල් කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප කියන මේ තුන්දෙනාට බණ කියන්ඩ වඩින වෙලාවේ මගදි මුන ගැහුණු කුමාරවරු තිස් දෙනාගෙන් ඇහුවෙත් මේකමයිනේ ඔබ කැමති අනුන් ගැන හොයන්ඩ තමන් ගැන හොයන්ඩද ? කියලා තමා ගැන කියලා කථා කරපු ප්‍රඥා වන්තයින්ට දේශනා කලා බණ මේ බණ අසා දාරණය කරගත් කුමාරවරු අරහත් ඵලයේ පිහිටා නැවත රජ ගෙදරට නොගිය බවයි සඳහන් වෙන්නේ.

එහෙමනම් අපි තමා පැත්තටම හැරුනොත් ඒකාන්තයෙන්ම අරිහත් ඵලය ලබන්න පුළුවන් වෙනවා. ඒ බව රහසක් වෙන්න බෑ ! ඒකයි මේ පැත්තට හැරුනේ දැන් මෙකද්ද තැන, දැන් ඔන්න දරුවා මොකද්ද ? දරුවා කියන්නේ ආයතන හයයි පණයි. පණ කියන්නේ මොකද්ද ? අදුරනවා කියන හැකියාව එහෙමනම් රූප අදුරනවා, ශබ්ද අඳුරනවා, ගන්ද, රස, ස්පර්ශ සිතුම් අඳුරනවා ඔන්න වැඩ හයයි ! ලඟ හයයි ! පිට හයයි ! දැනීම් හයයි ! ඔන්න ඔය ස්වභාවයේ ගමනට ජිවත් වීම කියලා කියන්නේ.

දැන් බලන්න තිරිසන් සත්තු ලගත් ඕකමනේ තියෙන්නේ අලියෙක් ගත්තත් කුඩා සතෙක් ගත්තත් ඒ කියන්නේ පුංචි මදුරුවෙක් ගත්තත් ඔය හයමනේ තියෙන්නේ මෙන්න මේ ඇහැ, කණ, නාසය, දිව, කය, මන යන ආයතන හයේ තියෙන ඇත්තම තත්වය හොයන්ඩ පිටින් බෑ ! තමන්ගේ දරුවටවත් ඇස් පේනවද කියලා නියම තීරණය කවදාවත් ගන්න බෑ. ඇහැට පෙනුනත් තමා තුලින්මයි මෙතන ඉන්න මේ කිසිම කෙනෙකුට කියන්න බෑ හාමුදුරුවන්ට ඇස් පේනවද කියලා. මටත් කිසිසේත්ම කියන්ඩ බෑ ඔබට ඇස් පේනවද කියලා පාටක් අරගෙන බැලුවොත් ඔය පාට නියම තීරණයේ තමන් විතරයි දන්නේ ඒ වගේමයි අනිත් ආයතනයන්ගේ දැනීමත්.

ඒ නිසා පිංවතුනි ආයතන හයතුල දැනීම් වලින්ම තේරුම් ගන්න ඕන දෙයක් ප්‍රත්‍යක්ෂයෙන්ම අවබෝධ කර ගන්න පුළුවන් තමන් තුලිම පමණයි. ලොකෙ අභ්‍යන්තර ආයතන තියෙන්නේ තමන්ට හයයි. ඊට වඩා එහෙම ලෝකේ අභ්‍යන්තර ආයතන නෑ ! ඒ නිසාම බුදු හාමුදුරුවෝ වදාරනවා ඔබම හදුනාගත යුතුයි. මටවත් බෑ ඔය හැකියාව ලබා දෙන්න නම්. ඒ කියන්නේ සම්බුදු කෙනෙකුටවත් තව කෙනෙකුට පෙනීම කියන එක ලබා දෙන්න බෑ ! තමන්ගේ ඇහෙන් තමන්ම බලන්න ඕන ඔන්න ඕක නිසාමයි බුදුහාමුදුරුවෝ සැම කාර්යයම බුද්ධ ගමනේ තියෙන්නේ ඔය ආයතන හය තුල කියලත් පෙන්නුවේ. බලන්න සිල් රකින්න තියෙන්නේ කොහොන්ද කටින්, ඇගෙන් ඒක මෙතන තියෙන්නේ පිට නෑ. සමාධිය වඩන්නේ කොහෙන්ද ? ආනාපාන සතියේ භාවනාව කොහොද ? නාසය තුල, පිළිකුල් භාවනාව කොහෙද ? කේශා, ලෝමා, නඛා, දන්තා, තචෝ, ...... ආදී වශයෙන් තියෙන කෑලි තිස් දෙක කොහෙද ? තමා තුල.

තථාගත සම්බුදු හාමුදුරුවෝ වදාල සියලුම සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් කොහෙද ? තමා තුල. ඉතිං මේ නිසා තමා තුලින් නිවන් දකින ගමන තමයි අපට හදුනාගන්න තියෙන්නේ. ඒකට තමයි

සන්දිට්ඨිකෝ කියලා කියන්නේ. කවදා තත්වයද දැන ගන්න ඕන. අනාගතයේදීත් පුළුවන්ද ? පෙනීම අදුරගන්න. අතීතයේ පෙනීමකුත් අපි ලබා ගත්තා. පුළුවන්ද අතීතයේ පෙනීම නවත්තගන්න ? එහෙම බෑ ! මේ ආයතන හයම හිස් ගෙවල් කියලා **ආසි විශෝපම සුත්‍රයේ** මැනවින් සඳහන් වෙනවා. මොකුත් පරණ දේවල් අපි ලඟ නෑ. පරණ රූප, ශබ්ද, ගන්ද, රස, ස්පර්ශ, සිතුම් මොකුත් නෑ. සමහරවිට බොහෝ අය හිතන් ඉන්නවා පරණ සිතුවිලි තියෙනවා කියලා එහෙම **"ලෝඩ්"** කරපුවා මෙහෙ නෑ ! එවේලෙට එවේලට සියල්ල සකස් වුන බවයි තථාගත බුදු හාමුදුරුවෝ වදාලේ. එහෙමනම් පෙනීම අදුරගන්න වෙන්නේ දැන් ඇහීම දැන් ආයතන හයේම දැනීම දැන් ඒව ඔක්කොම වර්තමානේ අකාලික දහමක් කියන්නේ ඔන්න ඔය නිසා මේක ඉතාම ගැඹුරින් හදුනා ගත්තා. මුළු ලෝකයම සකස් වෙන්නේත් දැන් කියලා සම්බුදු හාමුදුරුවෝ දේශනා කරනවා. මේ ගැඹුරු දහම මහා සාගරය බඳුයි මේ වෙලාවේ අනන්ත ගැඹුරු දහම ඉතා කැටි කොට තමයි මට දේශනා කරන්න වෙලා තියෙන්නේ. ඒ වගේම ඉතාම කැටිකර තමයි මේ දේශනා කරන්නේ.

බලන්න ඔන්න ඔය ආකාරයේ තමා තුලින් දැනගත යුතු, වර්තමානයේ දැනගත යුතු තමන් තමන් ලගට විත් පිට කිසිම රූප, ශබ්ද, ගන්ධ, රස බාහිර ආයතන වලට ගිහිල්ලවත් අදුරගන්න පුලුවන්කමක් ඇත්තේම නැති බව තමයි දේශනා කරන්නේ. පිංවත්නි ඒ වගේම මෙහි ඇති තතු වැහිලා තියෙන්නේ පංච නීවරන වලින් රූපයක් දකින කොට ඒකට තියෙන ආශාව, ආශාව හින්දා එන තරහ **(කාමච්ඡන්ද, ව්‍යාපාද)** තරහ එක්කම එන කම්මැලිකම **(ථීන මිද්ධය)** ඒවා වෙනුවෙන් ඇතිවන නොසන්සුන් බව. **(උද්දච්ච කුක්කුච්ච)** හා සැකය **(විචිකිච්ඡාව)** ආශාව හින්දා ඒ වෙනුවෙන්ම හිතන එක, කතා කරන එක, ක්‍රියා කරන බව කියලා එකක් අපේ මේ ජීවිතය තුල තියෙනවා. බලන්න ඕන කෙනෙකුගෙන් අහලා මොනවද මෙච්චරකල් කලේ කියලා, කියයි ඕන තරම් ඒව, නමුත් අපි කරල

තියෙන්නේ මොළෙන් හිතපු එකයි කටින් කථා කරපු එකයි, සර්වාංගේම හොල්ලපු එකයි විතරයි. ඉතිං උපන්දා ඉදන් කරනු ලැබුවේ ඔය වැඩ තුන, ජීවත් වෙනවා කියලත් කියනවා හැබැයි කොහොමද කලේ එක්කෝ ආශාවෙන් නැත්නම් තරහින් මොනවහරි දැක්කොත් ඒකට ආශයි. නැත්නම් තරහයි. ඔන්න ඔය දෙවිදිහ මුල්කරගෙන මොළෙන් හිතුවා කතා කලා, ක්‍රියා කලා. ඔන්න ඔය වැඩේ නිසා මේ ජිවත් වනවා කියන ස්වභාවය වැහිලා තියෙන්නේ. කවදාවත් කෙනෙක් හිතන්නේ නෑ මම මේ වැඩ තුන විතරක් කරන්නනේ මේ ජීවත් වෙන්නේ කියලා. මහන්සි වෙනවා කියලා. ඇඟ සකස් කරනවා කියලා, ගෙවල් දොරවල් හදන්නේ කියලා, ඉගෙන ගන්නේ කියලා, යුද්ධ කරන්නේ කියලා නේද ? විවිධාකාර යුද්ධ කරමින් අනන්ත ගමනක් සංසාරේ යන්නේ ඔය වැඩ තුන සඳහා නේ. මේකට තමයි පිංවත්නි කියන්නේ **"අවිද්‍යා පච්චයා සංඛාරා"** කියලා. මෝඩකම නිසාම චිත්ත සංඛාර වවනවා. වචීසංඛාර, කාය සංකාර වවනවා. මෙන්න මේ වැඩ තුන සකස් කරනවා. පිංවත්නි මේක කරන්නේ ඉතාම මෝඩ කමින් කියලා තමයි බුදු හාමුදුරුවෝ දේශනාකර වදාළේ. හැබැයි මේක තේරුම් ගත්තොත් **"කාමේසු විනෙය්‍ය ගෙධං"** ආශාවන්ගෙන් සම්පූර්ණයෙන්ම අයින් වෙනවා. **"නහි ජාතු ගබ්භ සෙයියං පුනරේතිතී"** නැවත උප්පත්තියක් ඇති වන්නේ නම් නෑ ! කියල තථාගත බුදුහාමුදුරුවෝ වදාරනවා. ඒක ඇත්තම ඇත්තක් පිංවත්නි. ඒක සත්‍යම සත්‍යයක් ඒක තමා තුලින් දන්නා මා මේ ප්‍රකාශ කරන්නේ පුනරුත්පත්තියක් නම් ඇතිවෙන්න බෑ ! මේ ලොකේ. ඇත්ත දැනගත්තොත්. ආශාව ඉතිරි වෙන්නේම නෑ ! ඉතිං ඒකට තමයි බුදු හාමුදුරුවෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූ හිතී කියලා දේශනා කළේ. නුවණින් හදුනාගත්තොත් සියල්ල එසේ වෙනවාමයි.

සතර සතිපට්ඨානය යනු කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාවයි.

කායානුපස්සනාව කියන්නේ මේ ඇඟ ගැන සියල්ල අවබෝධකර ගැනීමයි. වේදනානුපස්සනාව කියන්නේ දැනීම් හය ලැබෙන වෙලාවේම ඇතිවෙන කැමැත්ත අකමැත්ත නිසා පවතින තත්වයයි. චිත්තානුපස්සනාව කියන්නේ විඤ්ඤාණය විසින් මේ ලොව හදුනා ගන්නා ස්වභාව ශක්තියයි. දැනීමටයි, මළ මිනියක නැති අප ළඟ තියෙන හිතන්ඩ, කථා කරන්න, ක්‍රියා කරන්න ඕන කනේදි, ඇහේදි, නහයෙදි, දිවේදි, කයේදි, මනේදි මේ වර්තමානයේ උපදින දැනීම් සම්භාරයටයි. මේ හය ආකාරයේ දැනීමට කියනවා චිත්ත ස්වභාවය කියලා. මේක හොඳට හොයා බැලුවොත් රූප, වේදනා, සංඥා, සංකාර, විඤ්ඤානය කියන අංග පහකින් පරිපූර්ණ පංචස්කන්දයට කියලා තිලෝගුරු බුදු හාමුදුරුවෝ වදාරණවා. මෙන්න මේ පංචස්කන්දය නැමැති චිත්ත ස්වභාවය හරියටම හදුනාගත්තොත් මහා ප්‍රඥාව ඉපදුනා කියලයි සඳහන් වෙන්නේ. සෝවාන් ඵලයට, සකදාකාමී ඵළයට, අනාගාමි ඵලයට, රහත් ඵලයට පත් වන්න ඕන්න ඔය පංචස්කන්ධයම දැනගත යුතු බව බුද්ධ දේශනාවේ සඳහන් වෙනවා.

ඉතිං මේ ස්කන්ධ පහ තමා තුලින් හදුනාගන්නා ස්වභාවය තමයි අපි දන්නවා දරුවා කවුද කියලා බලන්න තමයි තිබෙන්නේ. එතකොට දරුවා කියන්නේ ආයතන හයට ආයතන හය නම් ඇහැ, කණ, නාසය, දිව, ශරීරය, මන එතකොට මෙතන තත්වය මොකක්ද? අපි ආයතන හය කියලා කතා කළාට බුදු හාමුදුරුවෝ මේක **"විභජ්ජවාදීව"** දේශනා කරනවා. එනම් කෙස්, ලොම්, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇට මිදුළු, මොළ ලොද, හෘදය වස්තුව, පෙනහැල්ල, ආමාශය, ආහාර, ඇල දිව, පිත්තාශය, කුඩා බඩවැල, මහා බඩවැල, ගුදය, අසූචි, අක්මා, වකුගඩු, කබ, කඳුළු, කෙළ, සොටු, සෙම, දාඩිය, තෙල්, ලේ, සැරව, මුත්‍රා ආදී වශයෙන් තිස් දෙවර්ගයක්, ගොඩක් වශයෙන් මේක පංගු තිස් දෙකක් දැන් පංගු තිස් දෙකෙන් එකකවත් අපිට හොයන්ඩ එහෙම පුළුවන්ද ? තමන්ට

දාලා තියෙන නමක් එහෙම "ගුණවති", "ධනපාල" කියලා එහෙම. එක තැනකවත් නෑ ! සියළු නම් බොරු, අම්මා, තාත්තා, දරුවා, සහෝදරයා, නැදෑයා ඒ මොකක්වත් නෑ ! එතකොට කුල, මල, ජාති, ආගම් භේද ඒ එකක්වත් එතන නෑ ! සිංහල තිස් දෙක කියලත් නෑ! ද්‍රවිඩ තිස් දෙක කියන්ඩත් නෑ ! මුස්ලිම් තිස් දෙක කියන්ඩත් නෑ ! පෘතුග්‍රිසි, ලන්දේසි, ඉංග්‍රීසි තිස් දෙක කියලත් නෑ ! මේ ලෝකේ නොදන්නෝ මේවට කුල, මල, ජාති, ආගම් භේද දාගෙන යුද්ධ කරනවා තථාගත බුදු හාමුදුරුවෝ දේශනා කරන්නේ " මාගේ දහම් දන්නෝ යුද්ධ නොකරති." කියලා. ලංකා තලයේ අවුරුදු තිස්ගානක් තිබ්බ යුද්ධෙ නම් ඔය අවබෝධය තිබුනානම් කිසිසේත්ම සිදු නොවෙනවාමයි. වෙන්නම බෑ ! තථාගත බුදු හාමුදුරුවෝ යුද්ධ නැවැත්තුවේ ඔය ධර්මය දේශනා කරලා. වෙන මොකුත් දේශනා කරලා නෙවෙයි. ඒකට කියන්නේ ප්‍රඥායුධය කියලා. සත්‍ය තමා තුලින් පෙන්නලා ආලවක යකා දමනය කලේ අංගුලිමාල දමනය කලේ සියල්ලෝම දමනය කලේත් කොටින්ම කීවොත් මාත් දමනය කලේ ඒකෙන්ම තමයි. අදමවුත් අඥානවුත් මෝහයෙන් පිරිච්ච මේ ලෝක තලයට ආපු මටත් මේ ලෝකයාටත් එකම සැනසිල්ල බුදුහාමුදුරුවෝ තමා කවරෙක්දැයි පෙන්නපු බුදුදහම හැර වෙන මොකුත්නම් නෑ කියලා ඕනම කෙනෙකුට බුදු දහම ඇතුලට රිංගපුවහම තේරෙනවා.

දැන් ඔය තිස් දෙක ඇතුලට තවත් රිංගන්ට ඕන, යන්ට ඕන කොහොමද රන්කරුවෙක් රන් අඳුරන විදිහට. දැන් රන් භාණ්ඩ පලඳින අය සත්‍ය දන්නෙ නැ. ඕක රත්තරන් නෙවෙයි කීවොත් පිළිගන්න වෙනව ඇයි තමන් දන්නෙ නෑනේ මොනවගෙන්ද හදල තියෙන්නෙ කියලා දැන් රන් භාණ්ඩත් එක්ක සෙල්ලම් කරන අයත් රත්තරන් අඳුරන්නේ නෑ. හැබැයි රන් සකසන පුද්ගලයා මේවා හොදට අඳුරනවා. අන්න ඒ විදිහට බුදු හාමුදුරුවෝ දේශනා කරනවා තමන් ගැනත් ඔය විදිහට රන් කරුවා රන් අඳුරනවා සේ උරගාලා බලන්න කියලා.

මොකකින්ද මේ කය සැකසිලා තියෙන්නේ යන බව. බුදු හාමුදුරුවෝ නම් සඳහන් කරන්නේ මේක සැකසිලා තියෙන්නේ ආහාර ගොඩකින් කියලා **"සබ්බේ සත්ථා ආහාරට්ඨිතිකා"** ඒ කියන්නේ මේ සත්තු ඔක්කොම හැදිල තියෙන්නේ කෑමෙන් කියලනේ ඒකනම් ඉතිං අහන්න දෙයක්යෑ අපි දන්නවා මේ ලොකේ ඕනෑම සතෙකුගේ කටින් ආහාර දාපුවාම ඇඟක් සකස් වෙනවා කියන එක. වෙනනම් ඇඟක් හැදෙන්න විදිහක් නෑ මෙපමණක් නෙවෙයි මව් කුස තුලට ගිහින් බැලුවත් මවගේ පියාගේ ලේ වලින්මයි මේ ඇඟක් සැකසෙන්නේ ඉතිං අම්මට තාත්තට ලේ කොහෙන්ද ඒකත් කෑමෙන්මයි එහෙමනම් කෑම නැත්නම් මේ ලොකේ ඇගවල් තියෙනවද එහෙමනම් ඇඟවල් එකක්වත් නෑ.

එතකොට ආහාර හැදෙන්නේ කොහොමද ? තවත් ඇතුලට හොයන්නයි බුද්ධානුශාසනාව අපි දන්නවා මේ ලෝකේ කිසිම ගහක් කොළක් හැදෙන්නේ නෑ පොලවේ පස් නැත්නම්, වතුර නැත්නම්, හිරු එළිය නැත්නම්, සුළං නැත්නම් ඒකාන්තයෙන්ම මේ හතර එකතුවක් තමයි අපි ආහාර කියලා ගන්නේ මොනවද **"පස්, වතුර, ගිණි, සුළං"** ගොඩක්මයි. මේක බොහොම හොඳට අදුරන්න පුළුවන් අපේ ඇග දිහා හොදට හොයලා බැලුවොත් මොකද වෙන්නේ. මැරුණම පස් බවට පත් වෙනවාමයි. කොහෙන්ද මේ **"පස්"** අර මුලින් ආහාර කියලා ඇතුල් කරපු පස් ගොඩම තමයි. එතකොට ජිවත් වෙන කාලේ වෙන මොකුත් මේ මල්ල ඇතුලේ තියෙන්න පුළුවන්ද ඒවත් පස්මයි.

> **"කුම්භූපමං කාය මිමං විදිත්වා**
> **නගරූපමං චිත්ත මිදං ඨපෙත්වා**
> **යෝජේත මාරං පඤ්ඤා උදේන**
> **ජිතංච රක්ඛෙ අණුවේ සිනොසියා"**

බුදු හාමුදුරුවෝ වදාලේ මේ කාර්යය මේක මතු පිටින් ඔහොම කීවට තේරෙන්නෙ නෑ. මං ඉතාම කෙටියෙන් මතක් කරන්නේ අපේ ගෙවල්වල කුස්සිවල මැටි වලං තියෙනවා විවිධ නම් වලිං මැටි කළේ, මැටි වළං ආදී වශයෙන් මේවට විවිධ නම් භාවිතා වනවා ඒ මැටි වලින් හදපු නිසා හැබැයි බලනකොට කුස්සියේ තියෙන්නේ මැටි මිසක් නම් වලින් නම් ගන්ට බෑ ! හේතුව මැටිටෙන් හදල තියෙන නිසා. මේසයක් ලීයෙන් හැදුවා කියමුකෝ ඉතිං එතන ලී තියෙන්නේ හේතුව ලී වලින් හදපු නිසා ඕනම භාණ්ඩයක් හදන්න අමු ද්‍රව්‍ය ගත්තනම් මොන නම් වලින් සඳහන් වුනත් තියෙන්නේ අමු ද්‍රව්‍යමයි. ඒකට බුදු හාමුදුරුවෝ දේශනා කරන්නේ **"ධාතු මත්ථකෝ නිස්සත්තෝ නිජ්ජීවෝ සුඤ්ඤෝ"** ඔතන ධාතු විතරයි තියෙන්නේ සත්වයෙක් පුද්ගලයෙක්, කෙනෙක්, ආතමයක් ඇත්තේම නෑ! ඇත්ත ඒක තමයි. එහෙමනම් පිංවත්නි අපි කවුද ? දරුවද ? මුලින් ගත්තොත් පස්, වතුර, ගිණි, සුළං නම් හදන්නේ අන්තිමටත් පස්, වතුර වෙනවානම් දැන් තියෙන්නේ පස්, වතුර ගිණි, සුළං ගොඩක්ම තමයි. එහෙමනම් පන්දමක් කරකවන්න ගත්තේ කරකවනකොට රවුම නතර උනාම පන්දමමයි. මුලත් මැදත් අගත් තුනම කල්‍යානමයි. රහසක් ඇත්තේම නෑ ! තුන් තැනම එකම දෙයක් තියෙන්නේ.

අපි හිතුවා මේ ඇඟ, දරුවෙක්, සහෝදරයෙක්, භාර්යාවක්, ස්වාමියෙක් කියලා. ඔන්න ආශාවක් ඇතිකර ගත්තා එතකොට මොකටද ආශාව ඇතිකරගෙන තියෙන්නේ පස් ගොඩකට නේද ? **"උඹේ කටෙත් පස්, මගේ කටෙත් පස්"** අන්දරේ කියපු කතාව හරි. ලෝකය වශයෙන් ගත්තොත් රන්, රිදී, මුතු, මැණික්, යාන-වාහන මොනවගෙන්ද ඒවත් සකස් උනේ පස්,වතුර, ගිණි, සුළං වලින්මයි. එහෙමනම් පිංවත්නි මේ ලෝකය යැයි ලෝකය යැයි කියලා කතා කරන්නේ පස්, වතුර, ගිණි, සුළං වලට වර්තමානයේ අපි දන්නා මේ ටිකටමයි.

නමුත් පිංවත්නි තථාගත බුදුරජාණන් වහන්සේ **"පඨවි, ආපෝ, තේජෝ, වායෝ"** කියල දේශනා කළේ පස්, වතුර, ගිණි, සුළං වලට නෙවේ. **"තද ගතිය, ඇලෙන වැගිරෙන ගතිය, උෂ්ණත්ව ගතිය, හමායන ගතිය"** කියන හතරටයි. මේක ගැඹුරු දහමයි. ඒ දහම තෝරා දෙන්න බොහෝ වේලාවක් ඕන. ලෝකයාට මේ දහම දෙන්න දින ගානක් ඕන. ඒ නිසා තමයි මම මුළු ලක්දිව පුරාම දින හතර බැගින් භාවනා වැඩ සටහන් කරමින් සැරි සරන්නේ. මෙහෙම සැරි සරන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන්නේ මොනවද කියන ගැඹුරු දහම දේශනා කරමින් ලෝකයේ මුල කියා දීලා වර්තමානයේ මේ තත්වය හෙළිදරව් කරලා අන්තිමට මේ කයට මොකද වෙන්නේ කියලා තමා තුලින් දකින්ට සැලැස්වීමටයි. කුමක්ද වෙන්නේ කබ, කඳුළු, සොටු, කෙළ, සෙම, දහඩිය, මළ, මුත්‍රා ආදි වශයෙන් ගලනවාමයි. ඇඟ ඇතුලට දාන කෑමෙන් සකස් වෙන ඇඟක් නමුත් ඒ මොහොතෙම කුණු වෙලා යනවා. හිල් වෙච්ච මුට්ටියකට කුණු වෙච්ච මස් ටිකක් දාපුවහම සිදුරුවලින් එළියට ගලා යනව වගේ මේ කයටත් දාන්ට දාන්ට ඇතුලෙන් කුණු වෙවී, කුණු වෙවී නව සිදුරකින් එළියට ගලනවා.

දැන් පිංවත්නි එහෙමනම් රකින්නේ මොනවද ? සිල් කඩන්නේ ආශාවට, තරහාවට, වටිනවද ? සිල් කඩන එකක් එකක් පාසා නුවණින් බලන්න. බණ කියන්න කාලය අඩුයි. මේ කෙටි කාලය තුල මතක් කළේ තමා කවරෙක්දැයි කියලා දැන් බලන්න තමා කවරෙක්ද ? සන්දිට්ඨිකයි මේ මොහොතේ අදුරාගතහැකියි ඇති වෙන, නැතිවෙන මුළු ලෝකයම මේ මොහොතේම මේකට කියනවා උදව්‍යය ඥාණය කියලා. "පෙනීම" ඇහැ ඇරල බලන්ට දැන් ඇතිවුනා ඇහැ වහගන්න ගමන්ම නෑ ! ආයතන හයේ දැනීම් මේ මොහොතෙමයි. එක මොහොතක් ජිවත් වන මේ සත්වයා හිතනවා මම දිගු කලක් ඉන්නවා කියලා.

ඇඟ බැලුවොත් ලෙඩෙක්මයි. මොහොතින් මොහොත මහල්ලෙක්මයි. දැන් දැන් මරණයක්මයි. මහල්ලෙක්. ලෙඩෙක්, මළ මිනියක් කියලා තුනක් තමා ඔබ පාවිච්චි කරන්නේ. සිද්ධාර්ථ කුමාරයා ගිහි ගෙය අතහැර දමා ගොස් පැවිදි දම් පුරා ආශාව නැත්තටම නැති කරගෙන අමාමහ නිවන් ලැබුවා කියන එක සත්‍යම සත්‍යයක්. මේ අවැඩ වූ අසාර වූ ලෝක තලයේ උප්පත්තිය නම් අත්හල යුත්තක්මයි.

බෞද්ධ පිංවතුන් මනු ලොව උපදී කළ යුතු එකම වැඩය නම් මහණ දම් පුරා සියළු කෙලෙසුන් නසා අමා මහ නිවන් ලබා ගැනීම කියන එකමයි. මා මුළු ලෝකයාට මේ මොහොතේ පෙන්වා වදාරන්නේ.

හොදයි, පිංවත්නි අපි කවුරුත් අවබෝධකර ගන්න ඕන අපි බෞද්ධයෝ නම් අපේ ගමන නිවන් කරා යන ගමනක් කියලා. භවයට යන ගමනක් නොවේ. ඒ නිසා අපේ උත්සාහ කෙසේ හෝ නිවන් ඉලක්කයම හිතට ගෙන සෑම මොහොතකම කටයුතු කරන්න ඕන. මෙසේ කටයුතු කරනකොට උපකාර වන දේවල් තමයි අපි කර්මස්ථාන කියලා කියන්නේ මේවා අමුතු දේවල් නොවෙයි. අපි අර එදිනෙදා ජිවිතයේ කියාපු දහඩිය, කෙළ, සොටු, සෙම ආදී දේවල් මේ තමන්ගේ ශරීරයේ ස්වභාවය මෙනෙහි කරන්න. අවස්ථාව ආවහම ඒක තම තමන්ගේ ශරීරයෙන් මෙනෙහි කරන්න. අන් අයගේ ශරීර ගැන බලමින්ද මෙනෙහි කරමින් වාසය කරන්න ඒවා මේ ලෝකයේ වැඩක් නෑ ! අත්හල යුත්තක් බව වැටහෙන්න බොහෝ ඉවහල් වෙනවා. ඒ වගේම ස්වක්ඛාතෝ භගවතෝ ගාථාවේ තේරුම තමා තුළින්ම අවබෝධකර ගන්න. මේ සංසාරයෙන් මිදීමට උපකාර වන්නා වූ ඒ මාර්ග ඥානය ඇතිකර ගන්න. සෝවාන්, සකදාගාමි, අනාගාමි, අරහත් කියන මාර්ග ඵල ප්‍රතිවේදයෙන් මේ සංසාර දුක්ඛය කෙළවර කර ඒ උතුම් මහා නිවන් සැනසීම උදාකර ගන්න ඔබටත් පුළුවන්.

අන්න ඒ නිසා මේ පිංවත් පිරිස ධර්ම ශ්‍රවණය තුලින් අපටත් ධර්මය දේශනා කිරීම තුලින් ඇතිවන්නාවූ යම් කුසල ධර්මයක් ඇත්ද ඒ සෑම කුසල ධර්මයක්ම අපි අනුමෝදන් කරමු. මේ විශ්වයේ අපේ ඥාතීන් ඇතුලු යම්තාක් මෙබදු කුසල් අනුමෝදන් වීමට කැමති දිව්‍ය බ්‍රහ්මාදී සියළුම දෙනාටත් මේ කුසල් අනුමෝදන් වෙත්වා. ඒ සියළු දෙනාටමත් අමා මහ නිවන් පිණිසම මේ කුසල ධර්මයන් හේතු වේවා. ඔබ අප සියළු දෙනාටමත් හැකිතාක් ඉක්මනින් මේ අත්භවයේදීම සෝවාන්, සකදාගාමි, අනාගාමි, අරිහත් කියන මාර්ගඵල ප්‍රතිවේදයෙන් උතුම් අමාමහ නිවන් සාක්ෂාත් කර ගැනීමට මේ ධර්මශ්‍රවණයම කුසලයත් හේතුවේවා කියල ප්‍රාර්ථනා කර ගන්න. සියළුම දෙනාට,

සම්මා සම්බුදු සරණයි !

සඳහම් පිහිටයි !

සඟ රැකවරණයි !



ඉසිපතන ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය වලල්ගොඩ චන්ද්‍රරතන හිමිගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන භාවනා වැඩ සටහන්.

| **ස්ථානය** | **මෙහෙයවීම** |
|---|---|
| බෞද්ධ මන්දිරය - මහනුවර | පූජ්‍ය වලල්ගොඩ චන්ද්‍රරතන හිමි |
| නගර ශාලාව - බදුල්ල | පූජ්‍ය බදුල්ලේ සූරියරතන හිමි |
| විශ්‍රාම ශාලාව-පොලොන්නරුව | පූජ්‍ය බදුල්ලේ සූරියරතන හිමි |
| බෞද්ධ මන්දිරය - රත්නපුර | පූජ්‍ය වලල්ගොඩ චන්ද්‍රරතන හිමි |
| හංවැල්ල (ආටිගල) | පූජ්‍ය වලල්ගොඩ චන්ද්‍රරතන හිමි |
| සර්වෝදය ශාලාව - නුගතලාව | පූජ්‍ය බදුල්ලේ සූරියරතන හිමි |
| පිලියන්දල ගොරකාපිටිය | පූජ්‍ය වලල්ගොඩ චන්ද්‍රරතන හිමි |
| මරදණ්කඩවල, තෝරුවැව | පූජ්‍ය කොළඹිස්සේ විමුක්තිරතන හිමි |
| කදිරාගම, ගලෙන්බිදුන වැව | පූජ්‍ය කොළඹිස්සේ විමුක්තිරතන හිමි |
| කැකිරාව, | පූජ්‍ය කොළඹිස්සේ විමුක්තිරතන හිමි |
| නන්දනාරාමය - වට්ටප්පල | පූජ්‍ය වලල්ගොඩ චන්ද්‍රරතන හිමි |

**විමසීම් :-** 077-6530056 / 077-4306437 / 072-2937350
081-4993329 / 081-3847889 / 072-6659501